මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIHS)
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීමයි

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIHS) අධ්‍යක්ෂ තනතුර සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය යනු, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපනය ලබා දීම, එම කටයුතු ප්‍රවර්ධනය හා සංවර්ධනය අරමුණු කර ගනිමින්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24A වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියමයක් මඟින් පිහිටුවන ලද ජාතික ආයතනයකි. ආයතනයේ ව්‍යුහය, බලතල, කාර්යයන් හා වගකීම් 2013 අංක 02 දරන මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය මඟින් නිර්ණය කර ඇත. එම නියමාවලියේ විධිවිධාන අනුව, අයදුම්කරු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර සාමාජිකයෙකු විය යුතුය.

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි නියමාවලියට අනුව අධ්‍යක්ෂවරයා පූර්ණකාලීන නිලධාරියෙකු වන අතර, ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා, ශාස්ත්‍රීය නිලධාරියා මෙන්ම ගණන් දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරයි. අධ්‍යක්ෂවරයා නිල බලයෙන් ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපතිකයෙකු හා සභාපති වන අතර, ආයතනයේ එක් එක් අධ්‍යයන මණ්ඩලවල ද සාමාජිකයෙක් වෙයි. අධ්‍යක්ෂවරයා එම තනතුරට පත් කරනු ලබන දිනයේ සිට වසර තුනක කාලයක් හෝ වයස අවුරුදු 65 සම්පූර්ණ වන තෙක් හෝ එම තනතුරේ සේවය කළ යුතු අතර, එම අවස්ථා දෙකෙන් පළමු ව එළඹෙන අවස්ථාවේ දී ධුර කාලය අවසන් වේ. අයදුම්කරු අයදුම්පත් භාර ගනු ලබන අවසන් දිනට වයස අවුරුදු 63ට වඩා අඩු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ආයතනයේ දැක්ම වන්නේ ශ්‍රී ලංකාවේ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි අධ්‍යාපනය, පර්යේෂණ සහ විචාරාත්මක චින්තනය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛතම ආයතනයක් බවට පත්වීමත්, කලාපීය මට්ටමින් විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් ලෙස ස්ථාපිත වීමත් ය. අධ්‍යක්ෂ ආයතනයේ ආයතනික සැලැස්මට අනුකූලව, නව අවශ්‍යතා මත පදනම් වූ බහුවිෂයීය අධ්‍යයන වැඩසටහන් හඳුන්වාදීම, අධ්‍යයන වැඩසටහන් හා පර්යේෂණ ක්ෂේත්‍ර පුළුල් කිරීම, පර්යේෂණ කටයුතුවල සක්‍රීයව නිරත වීම සහ ප්‍රජා සම්බන්ධතා හා ප්‍රජා සංවර්ධන කටයුතු ශක්තිමත් කිරීම තුළින් ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ කාර්යභාරය තවදුරටත් වර්ධනය කිරීම අරමුණු කර ඇත. ඒ අනුව, පශ්චාත් උපාධි ආයතනයේ (PGIHS) අරමුණු හා මෙහෙවර සාර්ථකව ඉටු කරමින් එහි ඉදිරි සංවර්ධනයට නව දැක්මක් එක් කිරීමට හැකි, ශක්තිමත් අධ්‍යයන පසුබිමක් සහිත, පර්යේෂණ හා කළමනාකරණ ක්ෂේත්‍රයන් හි විශිෂ්ට කාර්යසාධනයක් පෙන්නුම් කර ඇති, දුරදර්ශී දැක්මකින් හා විශිෂ්ට නායකත්ව හැකියාවන්ගෙන් සමන්විත පුද්ගලයෙකු පත් කර ගැනීමට පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලය අපේක්ෂා කරයි.

අපේක්ෂිත අයදුම්කරු සතු ව, පශ්චාත් උපාධි සුදුසුකම් විශේෂයෙන් ආචාර්ය උපාධි (PhD) සුදුසුකම් තිබීම හා පරිපාලන දැනුම පැවතීම අපේක්ෂා කෙරේ. එසේ ම, ඔහු/ඇය සතු ව, බහුවිෂය ක්ෂේත්‍ර සහිත අධ්‍යයන පරිසරයක රාජකාරී කිරීමට අවශ්‍ය අන්තර් පුද්ගල කුසලතා තිබිය යුතු අතර, ප්‍රජාවට සේවය කිරීම කෙරෙහි ආයතනයේ බැඳීම වටහාගත් අයකු විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරු ආයතනයට ශාස්ත්‍රීය නායකත්වය සැපයීමේ වගකීම දරන අතර, විශ්වවිද්‍යාලය තුළ පවත්නා වෙනත් ඒකක සහ ජාතික හා ජාත්‍යන්තර ආයතන සමඟ ක්‍රියාකාරී සබඳතා ස්ථාපිත කර ගත යුතුය.

අධ්‍යක්ෂවරයාට එම තනතුරට අදාළ වැටුප් සහ අනෙකුත් දීමනා හිමි වේ. අපේක්ෂිත අයදුම්කරුවන්, තම අයදුම්පත සමඟ, උපන් දිනය ඇතුළත් සම්පූර්ණ ජීවදත්ත පත්‍රිකාවක් (Curriculum Vitae), ආයතනයේ සංවර්ධනයට යෝජනා කරනු ලබන දැක්ම පිළිබඳ ප්‍රකාශයක් සහ තනතුරට පත්කරනු ලැබුවහොත් ඔහු/ඇය ඉටුකිරීමට අපේක්ෂිත කටයුතු පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කළ යුතුය. 2026 නොවැම්බර් මස 19 වන දින ප.ව. 4.00ට පෙර ලැබෙන සේ අදාළ අයදුම්පත, පුද්ගලික ව ගෙනැවිත් භාර දීම හෝ ලියාපදිංචි තැපැල් මඟින් සහකාර ලේඛකාධිකාරී, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය යන ලිපිනයට එවීම හෝ කළ යුතුය. අදාළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ "පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය. තවද, ඉහත සඳහන් ලේඛන සහ අදාළ අනෙකුත් ඇමුණුම් ලේඛනවල මෘදු පිටපත් ar@pgihs.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට PDF ආකාරයෙන් යොමු කළ යුතුය.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් 2024 ජනවාරි 01 දින නිකුත් කරන ලද 01/2024 චක්‍රලේඛයට අනුව තේරීම් කටයුතු සිදු කෙරේ. අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලැබීමේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛය මගින් දැනුවත් විය හැකි ය.

අවශ්‍ය වැඩිදුර විස්තර දූරකථන අංක 081-2388957 හෝ ar@pgihs.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය මගින් මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සහකාර ලේඛකාධිකාරී වෙතින් හෝ ආයතනයේ වෙබ්අඩවිය වන www.pgihs.ac.lk මගින් හෝ ලබා ගත හැකි ය.

සහකාර ලේඛකාධිකාරී
මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2026.10.20